-ලහිරු... තව ටිකක් ඈතට අපි ඇවිදගෙන යමු ද......?" මම ඈට පිලිතුරු වශයෙන් කිසිවක්ම නොකියා ඉදිරියට ගියෙමි.

කන්දෙන් කන්දට මාරුවෙමින් අපි ඇවිද ගියෙමු. ටාන්‍යා බලාපොරොත්තු නොවුණු සීතලක් අත්විඳින බව දැනී ගියෙන් මම ඈට මගේ කළු පාට හම් ජැකට්ටුව දුන්නෙමි.

-ස්තුතියි ලහිරු..." එසේ කිවූ ඈ මගේ මුහුණ බැලුවේ නැත. ඇය කල්පනාවට වැටී තිබිණි.

අපට නෙත ගැටුනු සෑම දර්ශණයකින්ම ඇය වශීවී සිටියාය. ඇයට සීමා රහිතව ඇවිදීමටත්, අසීමිත නිහැඬියාවකින් යුක්තව පරිසරයේ චමත්කාරය විඳගැනීමටත් අවශ්‍යව තිබුණි. ස්වභාව ධර්මයේ දුර්ලභ දායාදයන් සමඟ ආත්මීය වශයෙන් බැඳී ගිය ගුප්ත වූ නිශ්චලත්වය-ක් වෙනුවෙන් ඈ සිය මනස එහෙම පිටින්ම යොදවා තිබිණි...

අපි ආපසු වාහනය නවතා තිබූ තැනට පැමිණියේ මගේ උවමනාවටය. ඒ වන විට මද්දහන ද පසු වී තිබිණි. කාරය තිබුනේ හෙවනකය. මා දුන් බීම බෝතලය අතටගත් ඈ කාරයට ම හේත්තු විය. මම බොනට්ටුව මත හිඳ ගතිමි. මා රැගෙන විත් තිබූ කෑම ඇයට සැර අධික වූ නමුත් ඒවා ඈ කෑමට උත්සාහ ගන්නේ ඉතා රසවත් යැයි පවසමිනි. මම දිගට ම කතා කිරීමට උත්සාහ කළ ද ටාන්‍යා සිටියේ ඈත බලාගත්වනම කල්පනාවෙනි...

අප සිටි තැනට පහළින් වූ කඳු බෑවුමේ කුඩා දරුවන් පිරිසකගේ හඬක් ඇසෙන්නට විය. ටාන්‍යා මාර්ගය හරස්කර පාරේ එහා කොනට ගියේ ඔවුන් දැකීමට ය. වතුරට 'ජබොක්' ගා පනින හඬවල් ද ඒ සමඟම ඇසුනෙන් මම ද ඈට එකතු වීමි. පාසල නිමවා ගෙදර යමින් සිටි කුඩා වයස හයේ හතේ කොලු රෑනක් ම පොත් කිහිපය ගලක් මත තබා, ඇඳුම් උනා දමා, නිරුවතින් ම ගලායන දිය පහරට පනින්නට විය. ඒ හරියේ දිය කඳ තරමක් පුළුල්ය. ටාන්‍යා සිටියේ සිනාසෙමිනි. කළුම කළු ඒ කුඩා පැටවුන් අප දුටුවේ නැත. ඒ ඔවුන්ගේ සුපුරුදු දිනචර්යාව විය හැක. මටද සිනහ ගියේය. මා ඇගේ දෑස ඉදිරිපස වූ දසුන මගේ දකුණු අත්ලෙන් ඇගේ මුහුණට නොගැටී මුවහ කළේ විහිළුවට මෙනි. ඈ සිටියේ මට වම් පසිනි.

-ඇයි......?"

එසේ කියමින් මගේ මුහුණ දෙස වරක් බැලූ ටාන්‍යා ඇගේ දෑතින්ම මගේ අත්ල අල්ලාගත්තේ ය. එසේ අල්ලාගත්වන ම එය ක්‍රමයෙන් පහත දැමූ ටාන්‍යා සුසුමක් හෙළා ඇගේ හිස මගේ වම් උරයට හේත්තු කර ගති. නැවතත් ඇය ඈත බලාගත්වනම ගැඹුරු කල්පනාවකට වැටිණි. ඒ කුඩා පැටවුන් කෑ ගසමින් දිය කෙලින අන්දම ඈට ඒ මොහොතේ අමතක වී ඇති සේය. කලයුත්තේ කුමක් දැයි මගේ සිතට ද හැඟීමක් නොවීය. නමුත් ඈ දුකින් සිටිනවා දැකීමට මගේ සිතේ කැමැත්තක් නැත. ඈ එසේ මගේ අත දිගට ම අල්ලාගෙන සිටීම මා අපහසුවට ද පත් කළේ ය. තවත් වේලා එසේ සිටිය යුතු නැතැයි සිත කියයි.

-ටාන්‍යා අපි යමු ද?" ගලක් සේ නිසොල්මන්ව මොහොතක් සිට මම සෙමින් එසේ පැවසුවෙමි.

ඈ මගෙන් ඈත් විය. එහෙත් ඒ අවස්ථාව කල්පයක් තරමටම දිගුකර දෙන්න යැයි මගේ යටි සිත මට කන්නලව් කරමින් තිබිනි.

-තව ටිකක් ඉඳිමු ලහිරු..."

මා දෙස නොබලාම එසේ කිවූ ටාන්‍යා පහත් වී පාර අයිනේ බිම හිඳගති. අප සිටියේ කඳු බෑවුම දෙසට නෙත් යොමාගෙනය. කරකියා ගත හැකි යමක් සිතාගත නොහැකි වූයෙන් මම මදක් වේලා නිසොල්මනේ ඒ ආකාරයෙන් ම සිටිගෙන සිටියෙමි. පාර අයිනේ මදක් ඈතට වන්න කන්ද පැත්තට තනා තිබූ ගල් බැම්මේ අතරින් පතර සුදු පාට කුඩා වනමල් පොකුරු පිපී තිබෙනවා දුටු මම ඒ දෙසට ගමන් කළේ මල් කිහිපයක් එකතු කර ගැනීමේ අදහසිනි. මම ඒ මල් රැගෙන නැවත පැමිණියේ ටාන්‍යා වෙතය. ඒ මල් ස්වල්පය ඈ වෙතට දිගුකරන ගමන් ඇය පසකින් මාද බිම හිඳගතිමි.

-ස්තුතියි ලහිරු" එවර ඈ කීවේ සිනා-සෙමිනි.
ටාන්‍යා තවමත් සිටියේ මගේ ජැකට්ටුව හැඳගත් ගමන්මය. ඇගේ ඒ පෙනුම මා සිතට නිරන්තරයෙන්ම විශේෂත්වයක් එක්කල නමුත් හැකිතාක් දුරට ඒ විශේෂත්වය අමතක කරදැමීමට මම උත්සාහ ගතිමි.

-ටාන්‍යා... ඔයා මේ දවස්වල මොනවද කරන්නෙ?" යමක් කතා කරන්නට අවශ්‍ය යැයි සිතුනු බැවින් ම මම එසේ ඇසුවෙමි. එහෙත් ඈ සුසුමක් හෙළා නිහඬ විය. මා ඇසූ මෝඩ ප්‍රශ්නය හරිගස්සා ගැනීමට යැයි සිතා තවත් එවැනිම මෝඩ ප්‍රශ්නයක් මම ඇසුවෙමි.
-ඔයා ළඟදී ම ආපහු පර්ත් යනව ද?"
එහෙත් ඒ උත්සාහය සාර්ථක විය.
-තව සතියකින් මහේලයි මමයි යනව ආපහු පර්ත්."
-ඊට පස්සෙ...?" නොඇසන්නෙමැයි සිතා සිටි තොරතුරු ඇසිය යුතු යැයි දැන් සිත කියයි.

-මම හරියට ම දන්නෙ නැහැ ලහිරු මහේල මොනව හිතන් ඉන්නව ද කියල... මම මෙහෙ ආවෙ හරි ආසාවකින් මහේලගෙ පවුලෙ අය අඳුනගන්න. ඒත් එයා තවම මාව එයාලගෙ ගෙදර එක්කගෙන ගියේ නැහැ...... එයාලගෙ අයියව විතරයි එක්කගෙන ඇවිත් මට අඳුන්නල දුන්න හෝටලේ දී ම..."

මට මහේල ගැන තරහක් ඇති විය. එහෙත් තත්වය තවත් බැරෑරුම් කිරීම මගේ යුතුකම නොවේ යැයි සිතාගතිමි. -තව සතියක්ම ඔයාල ඉන්නවනෙ ටාන්‍යා... එයා එක්කගෙන යයි ගෙදරට... ඔයා කලබල වෙන්න එපා ඒ ගැන..."
-මම හිතන් නැහැ ලහිරු ඒක සිද්ධ වෙයි කියල."
-ඇයි ඒ....?"
-මහේල අයියටත් මාව අඳුන්නල දුන්නෙ එයාගෙ යාළුවෙක් හැටියට විතරයි....."

මට ඈ ගැන ඇත්තෙන් ම දුක සිතුනි. 'කසාද බඳින්නම නෙමෙයි... ඉන්න ටිකේ සොමියටත් එක්ක දාගනින්....' යයි දිනක් මහේල ටාන්‍යා ගැන කියූ කතාව මට සිහිවිය. එය එසේ නොවිය යුතු යැයි මම පතමි. එය එසේ වුවහොත් මේ අසරණ කෙල්ල කොයි තරම් දුක් වේවිද? ඒත්, මහේලගේ හිතේ ඇත්තේ කුමක් දැයි කවුරු දනිත් ද? මම ඔහුට ඒ පිළිබඳව කතා කරමියි සිතාගත් නමුදු ටාන්‍යාට ඒ ගැන කියන්නට නොගියෙමි.

-ටාන්‍යා ඔයාට තේරුම් ගන්න බැරි හින්දයි ඔයා ඔහොම දුක් වෙන්නෙ. අපේ රටේ පවුල්වල තත්වය ටිකක් වෙනස්... ඇත්තෙන් ම ටිකක් බැරෑරුම් ඔයාලට වඩා..." ඈ සැනසීමට යමක් කිව යුතුයැයි සිතුණ බැවින් ම මම එසේ කීවෙමි.

-ඒ තත්වය ඔයා අමුතුවෙන් තේරුම් කරල දෙන්න ඕනැ නැහැ මට ලහිරු.... අපේ ගෙවල්වල අපි හැදෙන්නෙත් හිතූ හිතූ හැටියටම දේවල් කරන්න අපිට පුළුවන්ය කියල හිතෙන තත්වයක නෙමෙයි..."

එය එසේ නොවේ යැයි කීමට මට අයිතියක් නැත. මම නිහඬ වුණෙමි.
-ලහිරු... ඊයෙ රෑ මම ඔයාගෙ අම්මට කතා කළා..."
-අපේ අම්මට..." මම පුදුම වුණෙමි.
-ඔව්. ඔයාගෙ අම්ම හරි හොඳ කෙනෙ-ක්..... මට ඒක පර්ත් වලදී ම තේරුණා. මම පාළුවේ ඉන්න බව කිව්වහම අම්ම කිව්ව එහෙ එන්න කියල... මම කිව්ව ඔයා කැමැති වුණොත් මම ඔයත් එක්ක එන්නම් කියල..."
මේ මොන පැටලැවිල්ලක් ද? අම්මා මො-නවා සිතනවා ඇත් ද? මහේලත් ටාන්‍යාත් අතර සම්බන්ධයක් අම්මා දන්නේ යැයි සිතිය නොහැක.

-මහේලට කතාකරල ගියා නම් නේද හොඳ ටාන්‍යා...?"
-මම මහේලට රෑම කතා කළා ලහිරු. එයා තමයි කිව්වෙ ඔයත් එක්ක යන්න කියලා..."

මහේලගේ අදහස මට දැන් තේරුම් යයි. එහෙත් ටාන්‍යා තුළ අතිකර තිබෙන බලාපෙරොත්තු වලට පිටස්තරින් ඔහුට ක්‍රියා කිරීමට ඉඩ නොදෙන්නෙමියි මම සිතාගතිමි.
-ටාන්‍යා... මට දෙන්න මහේලගෙ අංකය..."
මා මගේ දුරකථනය සාක්කුවෙන් ඉවතට ගතිමි.
-හලෝ...." අනිත් කොනෙන් පිළිතුරු දුන්නේ මහේලය.
-මහේල.... මම මේ ලහිරු කතාකරන්නෙ"
-ආ... ලහිරු... කොහොමද?"
-මහේල උඹ දැන් ඉන්න තැන කියපං... මට ඇවිත් හම්බවෙන්න ඕනැ. ටිකකට."

මා කතා කළේ සිංහලෙනි. ඒ මහේලට නිදහසේ කිව යුතු දේ කීමට ඉඩ සලසා දීමටය. නැත්නම් ටාන්‍යා මා අසල බව දන්නා බැවින් ඔහු අදහස් තෝරා බේරා කතා කිරීමට පෙළඹෙනු ඇතැයි මට සිතිනි.

-මොකද්ද බං හදිස්සිය?"

-හදිස්සියක් නෙමෙයි මහේල. අම්ම කිව්ව උඹට එන්න කියන්න කියලා ටාන්‍යත් එක්ක අද රෑ කෑමට අපේ ගෙදර. එදා පර්ත්වලදීත් උඹල දෙන්නට එන්නයි කියල තියෙද්දී එන්න බැරි වුණානෙ. මම කැමැති නැහැ අදත් ඒ පොරොන්දුව කඩවෙනව දකින්න...."
-සොරි මචං එදා නම් එන්න බැරි වුණාට. ඒ වුණාට මේ දැන්ම මට එන්න බැහැ. මම රෑ වෙන්න ඉස්සෙල්ල ගෙදෙට්ට එන්නම්..."

-උඹ කොහොමද තැන හොයාගන්නෙ... අනික... එන්න හිතන් ඉන්නෙ බස් එකේද?"

-මම දන්නව තැන. මට අයියගෙ කාරෙක ඉල්ලගෙන එන්න පුළුවන්...."

-ඒක හුඟක් හොඳයි. මොකද මම හෙට උදේ ම වැඩට යන්න ඕනැ. ටාන්‍යාව ආපහු එක්කගෙන එන්න මට වෙලාවක් වෙන්නෙ නැහැ..."

-ඕකේ මචං. මම එක්කගෙන එන්නම්... දැන් උඹත් එක්ක නේද ඉන්නෙ ටාන්‍යා..."

-දැන් අපි ඉන්නෙ හන්තාන ටී ස්ටේට් එකේ. උඹ කැමැති නම් මම උඹ ඉන්න තැනට ගෙනත් ඇරලවන්නම්... එතකොට දෙන්නට ම එකට යන්න පුළුවන්නෙ."

-අන් ප්ලීස් ලහිරු ලොකු උදව්වක් උඹට එක්කගෙන යන්න පුළුවන් නම් ටාන්‍යාව... මම එනකොට කළුවර වැටෙයි... ඒකයි... මම ෂුවර් එකට ම එනව..."

-හොඳයි. එහෙනම් හම්බ වෙමු..."

-ඕකේ මචං සී යූ..."

මම නැවත වරක් දුරකථනය ක්‍රියාත්මක කළෙමි. ඒ අම්මාටය. එහෙත් එය අතට ගත්තේ වැඩට සිටින පියදාසය. අප තිදෙනා රෑ කෑමට ගෙදර එන පණිවිඩය අම්මාට දෙන්න යැයි ඔහුට බාර දී මම එය නවතා දැමුවෙමි.
ටාන්‍යා කිසිවක් ම නොවිමසා මා කතාකරන තුරු මදෙස බලා සිටියේය. වැඩිමහල් සොහොයුරෙක් තුළ සොහොයුරියක් කෙරෙහි ඇතිවන ආකාරයේ වගකීමෙන් යුතු වූ හැඟීමක් ඒ මොහොතේ මා තුළ ඈ වෙනුවෙන් ඇතිව තිබුණි.
-ටාන්‍යා අපේ ගෙදර යනව නම් දැන්ම අපි යන්න ඕනැ.... නැත්නම් රෑ වෙනව..." ඈ කීකරු දැරියක් මෙන් නැගී සිටියේ සතුටිනි.

-හුඟක් දුරද?"
-පැයක් දෙකක් විතර යයි... නමුත් රෑ වෙන්න කලින් යන්න මම කැමැතියි ගෙදරට...." කළුවර වැටීමට පෙර ඇය ගෙනගොස් අම්මාට බාරදීම මගේ යුතුකමක් ලෙස මම සිතාගතිමි. එසේ නොවේ නම් එය ඇගේ නම්බුවට මෙන් ම මගේ නම්බුවට ද කැළලකි.

ලබන කලාපයට

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S., Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST


Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Orthodontics
10% Discount for Senior Citizens, Pensioners and Healthcare Cardholders till end 2005
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760